**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -4 කොටස - 2019**

---

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - 4 කොටස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, දැනටමත් ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීමෙන් වාණිජ නගරය (කොළඹ) සහ අලුතින් ඉදිකරන ලද වරාය (හම්බන්තොට) සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධතාවයක් ඇති කිරීමයි. ව්‍යාපෘතියේ අදියර 04 යටතේ අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා කිලෝමීටර් 25 ක දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 55,965 ක් වූ අතර ඉන් සිවිල් කොන්ත්‍රාත් වැඩ සහ උපදේශන සේවා සඳහා රු. මිලියන 55,615 කට සමාන එ.ජ.ඩො. මිලියන 435 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. රු. මිලියන 350 ක් වන ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි 19 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබූ අතර පසුව 2019 ජූලි 09 දක්වා දීර්ඝ කරන ලදී.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ  අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 ජුනි 19 දිනැති සුහදව නිරවුල් කිරීමේ කමිටු (Amicable Settlement Committee) තීරණයට අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 132 ක අලාභයක් සිදුවී ඇති අතර එය නොනිම් වැඩවලට මාරුකර නොතිබුණු අතර මූල්‍ය | ව්‍යාපෘතියට අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ හැකියාව. | මෙම මුදල මහාමාර්ග අමාත්‍යාංශයේ අනුමැතිය මත 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ නොනිම් වැඩවලට මාරු කර ඇත. | ඉදිරියේදී ගිවිසුම්වලට එළඹීමේදී විදේශ විනිමය අනුපාතය නිශ්චිතව තීරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක **08** ට පටහැනිව, **2019** දෙසැම්බර් වන විට රු. මිලියන **16** ක වන්දි ගෙවීමේ ප්‍රමාදය මත පොලිය සඳහා ප්‍රතිපාදන සපයා නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවප්‍රමාණය වීම. | එකඟ වෙමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සිදුකළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි **14.7** සහ **14.8** උප වගන්තිවලට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද පොලිය සහ ප්‍රමාද පොලී සඳහා ප්‍රමාද ගාස්තු ලෙස පිළිවෙලින් රු. මිලියන **330** ක් සහ රු. මිලියන **98** ක් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, ඇතිවිය හැකි වගකීම හඳුනාගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවප්‍රමාණය වීම. | එකඟ වෙමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව ප්‍රතිපාදන සිදුකළ යුතුය. |

**3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 106 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිලි මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා 2019 ඔක්තෝබර් 19 දින ධනාත්මකව යෝජනා කර තිබුණි. කෙසේ වෙතත්, 2021 ජනවාරි 08 දින දක්වා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම යෝජනාව අනුමත කර නොතිබුණි. | ගොඩනැගිලි අයථා පරිහරණයට ඇති හැකියාව. | ගබඩා ලෙස භාවිත කිරීමට කාර්යාල පරිශ්‍රයෙන් කොටසක් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දී ඇති අතර පළාතේ තත්ත්ව පාලන කටයුතු සඳහා රසායනාගාර උපකරණ සහිත එක් ගොඩනැගිල්ලක් පළාත් අධ්‍යක්ෂ (දකුණ) වෙත භාර දෙන ලදී. ඉතිරිය මා.සං.අ. යේ ධාරිතා වර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වෙන් කරන ලද අතර අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ව්‍යාපෘති කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීමේදී, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි **20.6** උප වගන්තියට අනුව බේරුම්කරණ කටයුතු වැඩ නිම කිරීමට පෙර හෝ පසුව ආරම්භ කළ හැකිය. එබැවින්, රු. මිලියන **509** ක ආරවුල් හිමිකම් **3** ක් අතෘප්තිකර නිවේදන **(Notices of Dissatisfaction)** නිකුත් කිරීමෙන් පසු බේරුම්කරණය සඳහා තවමත් | නිශ්චිත කාල සීමාවක් නොමැතිකම නිසා අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු අපව දැනුවත් නොකරන අතර ආරවුල් බේරුම්කරණ මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුට අවාසිදායක තීරණයක් ලබා දී ඇති අතර, බේරුම්කරණ | අතෘප්තිය පිළිබඳ දැන්වීමක් **(Notice of dissatisfaction)** නිකුත් කිරීමෙන් පසුව, බේරුම්කරණය ආරම්භ කිරීම සඳහා විශේෂ |

| | | | | |
|---|---|---|---|---|
| | විවෘතව පවතින අතර ව්‍යාපෘතියේ දෝෂ දැනුම්දීමේ කාලසීමාව (Defect notification period) අවසන් වී මාස 06 ක් ඉකුත්ව තිබුණද කොන්ත්‍රාත්කරුගේ හිමිකම්පෑම අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | | ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපට හැකියාවක් නැත. | කොන්දේසි තුළ නිශ්චිත කාල සීමාවක් ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | 2018 ජනවාරි 15 දින 38 (අ) වගන්තියේ දැන්වීම ප්‍රකාශයට පත් කර තිබුණද, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් කැබලි 05 කට වන්දි මුදල් 2021 ජනවාරි 13 වන විටත් ගෙවා නොතිබුණි. | අමතර පොලී වියදම් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | තක්සේරු කිරීම් එකී කැබලිවල ඉඩම් හිමියන් විසින් පිළිනොගැනීම හේතුවෙන් කැබලි 5 ක් සඳහා වන්දි ගෙවා නොමැත. එබැවින්, මෙම කාරණය වන්දි සමාලෝචන කමිටුව වෙත යොමු කරන ලද අතර මා.සං.අ. හි ඉඩම් අංශය විසින් අඛණ්ඩව පසු විපරම් කරනු ලැබේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | බලපත්‍ර 31 කට අදාළව එ.ජ. ඩොලර් 1,415,215 ක් වූ ප්‍රති අපනයනය කළ හැකි භාණ්ඩ 2018 වර්ෂයේදී කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, එම ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලීමක් හෝ වත්කම් ලැබීම් පිළිබඳ තහවුරු කිරීමක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් අයථා ලෙස පරිහරණය කිරීමට ඇති හැකියාව. | විගණකාධිපතිවරයා වෙත යැවීම සඳහා මෙම හුවමාරුව පිළිබඳ සාක්ෂි සපයන ලෙස ඉල්ලා කොන්ත්‍රාත්කරු වෙත සිහි කැඳවීමක් දැනටමත් යවා ඇත. | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියෙන් එම වත්කම් ලැබීම් තහවුරු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මත්තල සහ හම්බන්තොට අන්තර් හුවමාරුවේ පිවිසුම් ගේට්ටු (Tall Gates) සඳහා අමතර පාලම් තරාදි දෙකක් ඉදිකිරීම සඳහා විචලතා නියෝගයක් යටතේ රු. මිලියන 1.9 ක මුදලක් වැය කර තිබුණි. එය ඉදිකර මාස 10.5 ක් ගතවී ඇතත්, විගණිත දිනය වූ 2021 ජනවාරි 06 දින දක්වා එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වත්කම් භාවිතයට නොගෙනම දිරාපත්වීමේ හැකියාව. | එම පාලම් තරාදි අධිවේගී මාර්ග මෙහෙයුම් හා නඩත්තු අංශයට භාර දී තිබූ අතර අවශ්‍ය පරිදි ඒවා භාවිත කිරීමට නියමිතය. | සියලුම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | තාක්ෂණික පිරිවිතරවල 101.10 උප වගන්තියට අනුව, මිනුම් උපකරණ සහ පරිභෝජන ද්‍රව්‍ය ව්‍යාපෘතිය අවසානයේ සේවායෝජකයා වෙත ආපසු භාරදිය යුතු අතර ඉංජිනේරුවරුන්ට මිනුම් උපකරණ සැපයීම සඳහා ඉඩහල ගෙවීම් | ව්‍යාපෘතිය අවසානයේදී භාර දෙන වත්කම්වල නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි වීම. | කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගත් සහ සැපයූ වත්කම් පිළිබඳ සවිස්තර වාර්තා උපදේශක විසින් පවත්වාගෙන යනු ලැබේ. ව්‍යාපෘතිය අවසානයේ මෙම සම්පූර්ණ වත්කම් නිසි පරිදි | සියලුම වත්කම් සඳහා නිසි වාර්තා පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (Provisional Sum) අයිතමයක් ලෙස රු. මිලියන 7.4 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය විසින් එම භාණ්ඩවල වටිනාකම පිළිබඳව ලේඛන නඩත්තු කර වාර්තා තබා නොතිබුණි. | | මා.සං.අ. වෙත භාර දී ඇත. | |
| (උ) | බස් සහ දුම්රිය ගමන් පර්යන්තයක් ඉදිකිරීමට බිල්පත් අංක 900 හි අයිතම අංක 27 සඳහා රු. මිලියන 3,000 ක මුදලක් වෙන් කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් කර තිබුණද පර්යන්තය ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. තවද, එම ඉතුරුම් ව්‍යාපෘතියේ වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමේ අරමුණින් මෙම යෝජනාව අවලංගු කර සංශෝධිත ප්‍රමාණ පත්‍ර වල ඇතුළත් කර තිබුණි. | භාවිතයට නොගත් ණය මුදල මත කැපකිරීම් ගාස්තුවක් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | මෙම දුම්රිය සහ බස් පර්යන්තය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාදී නොතිබුණු බැවින්, එය ක්‍රියාත්මක නොවූ අතර මුදල්, ව්‍යාපෘතිය අවසානයේ වෙනත් කිසිදු කටයුත්තක් සඳහා වැය නොකර ඉතිරිවී ඇත. | ප්‍රමාණ පත්‍ර නිවැරදිව ඇගයීම සිදුකළ යුතුය. |